


- **නිශ්චල දේපළ නියෝජිතයන්,**
- **මැණික් හා ස්වර්ණාභරණ වෙළඳුන්,**
- **කැසිනෝ ව්‍යාපාර,**
- **නීතිඥවරුන්,**
- **නොතාරිස්වරුන්,**
- **භාරයන් හෝ සමාගම් සේවා සපයන්නන්**
- **ගණකාධිකාරීවරුන්**

# සමඟ ගනුදෙනු සිදු කරන්නේද?

**එසේ නම්,**

ඉහත සඳහන් ආයතනයක් සමඟ ඔබ ගනුදෙනු සිදු කරන අවස්ථාවකදී හෝ ඔබේ තොරතුරු වරින් වර සමාලෝචනය කරන අවස්ථාවේදී  හෝ නම් කරන ලද මුල්‍ය නොවන ව්‍යාපාරය ඉල්ලා සිටින පහත තොරතුරු සපයන්න.

- සම්පූර්ණ නම;
- ස්ථිර පදිංචි ස්ථානයේ සහ තැපැල් ලිපිනය;
- රැකියාව, සේවායෝජකගේ හෝ  ව්‍යාපාරයේ නම, ස්වභාවය හෝ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු;
- ඔබේ, එනම් පාරිභෝගිකයා හෝ වාසිදායක හිමිකරුගේ ඡායාරූපය ඇතුළත් නිල පෞද්ගලික හැඳුනුම්පත හෝ වෙනත් යම් හඳුනාගැනීමේ ලේඛනයක් (උදා: ජාතික හැඳුනුම්පත, වලංගු ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය);
- උපන් දිනය;
- ජාතිය;
- අරමුදල් මූලාශ්‍ර;
- ගනුදෙනුවේ අරමුණ;
- දුරකථන අංක (නිවස, කාර්යාලය හෝ ජංගම).

එසේම ඔබ ලබා දුන් ඉහත තොරතුරු වල යම් වෙනස්කමක් සිදුවුවහොත් එය දැනුම් දීමද ඔබ සතු යුතුකමකි.

නම් කරන ලද මුල්‍ය නොවන ව්‍යාපාරය සමඟ ගනුදෙනු සිදු කිරීමේදී  ඔවුන් ලබා දෙන සේවාවේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා සහ මූල්‍ය අපරාධ අවදානමෙන් රට ආරක්ෂා කරගැනීම සඳහා නීතිමය අවශ්‍යතාවලට අනුකූලව ඔබේ තොරතුරු රැස් කරයි.

මූල්‍ය අපරාධවලින් ආරක්ෂා වීමට හා කාර්යක්ෂම සේවාවන් සඳහා පහසුකම් සැලසීමට නම් කරන ලද මුල්‍ය නොවන ව්‍යාපාර ඉල්ලා සිටින තොරතුරු ලබාදෙමින් ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම ඔබගේ වගකීමයි.

එබැවින්, මේ සඳහා ඔබගේ සහයෝගය ඉල්ලා සිටිමු.

**මේ පිළිබද වැඩි විස්තර සදහා මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරන ලද "2018 අංක 1 දරන නමෝද්දිෂ්ට මුල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති" වෙත යොමු වීමට පහත QR කේතය ස්කෑන් කරන්න.**

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

මූල්‍ය බුද්ධි ඒකකය
நிதியியல் உளவறிதல் பிரிவு
FINANCIAL INTELLIGENCE UNIT

අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01
☎ 0112477125 | Fax 0112477692 | @ fiu@cbsl.lk | www.fiusrilanka.gov.lk